## ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
## 31.05.2018 දින පැවැත්වූ දේශනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මාසම්බුදු පියාණන්වහන්සේට අතීතයත් අනාගතයත් වර්තමානයත් කියන කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන් පැහැදිලිව පිරිසිඳුව තමන්ගේ සවයංභූ ඥානයෙන්ම අවබෝධකොට ගත්තා වූ කරුණාවෙන් දයාවෙන් මෛත්‍රීයෙන් පිරුණා වූ සන්තානයක් ඇති සංසාරයේ දුකින් පෙලෙන්නා වූ සත්වයන්ට නිර්වාණ මාර්ගය දක්වා වදාරන්නා වූ, සත්වයන්ගේ විමුක්තිය ඉත සිතින්ම කැමති වෙන්නා වූ, අනන්ත අප්‍රමාණ ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා! ඒ ශාන්තිනායක සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ සන්තානයේ පහළ උනා වූ දේශනාකොට වදාළා වූ අති ගාම්භීර වූ ප්‍රණීත වූ ශ්‍රී සත්ධර්ම ස්කන්ධයට, ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ ධර්ම මාර්ගයේ ගමන් කොට උතුම් වූ නිර්වාණ ධාතුවට පත්වී වදාළා වූ ආහුනෙයිය ආදී ගුණයන්ගෙන් පිරුණා වූ ජීවිත ඇති අශ්ඨාර්ය පුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා! බුද්ධ රත්නයේ ධම්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාව බලයෙන් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ මොහොතකට මෙනෙහි කිරීම, වන්දනා කිරීම තුලින් පහළ උනා වූ කුසල චේතනාවන්ගේ, පුණ්‍ය චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අසාගෙන සිටින්නාවූ මේ පින්වතුන් මේ මොහොත වෙනකල්ම සීල සමාධි ප්‍රඥා වශයෙන් උපදවාගත්තු සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් අපි මේ කථා කරන්න යන ධර්ම කරුණු ටික පැහැදිලිව පිරිසිඳුව යහපත්ව තේරුම් ගන්න ලැබේවා! මේ දහම් වැඩසටහන තුලින් කියාදෙන ධර්ම කරුණු එක එකක් පාසා ඉතාමත්ම හොඳින් වටහා ගැනීමට තේරුම් ගැනීමට සිහිය පහළ වේවා! නුවණ පහළ වේවා! ඥාන ආලෝකය පහළ වේවා! හිත සමධීගත වේවා! සමාධීගත වූ සිතකින්, එකතැන් වුනාවූ හිතකින්, නුවණින් පිරුණා වූ හිතකින් තථාගතයන් වහන්සේ විසින් අවබෝධකොට දේශනා කොට වදාළ මේ උතුම් ධර්මය මෙනෙහි කර කර අවබෝධ කරගෙන පාරමී ධර්මයක් බවට පත්කරගෙන ධර්ම මාර්ගයේ ගමන්කොට නිවනින් සැනසෙන්ට ලැබේවා! කියලා මෛත්‍රියෙන්

ප්‍රාර්ථනා කරනවා. කාරුණික මේ ප්‍රාර්ථනාවත් එක්ක අද මේ වෙලාවට නියමිත ධර්ම කාරණා ටික අපි මතක් කරන්න බලාපොරොත්තු වෙනවා.

බුදුපියාණන්වහන්සේගේ ධර්මයේ අපි මේ දවස්වල කථා කරන්නේ 'පට්ඨාන' ධර්ම කාණ්ඩයේ වීථි ධර්ම පිළිබඳව තිබෙන කොටස. අපි ගිය සතියේ ධර්ම කාණ්ඩයක් එකතු කරගත්තා. ඒ කොටසේ අපි කථා කළේ 'අධිපති ප්‍රත්‍යය' පිළිබඳව. අපේ පින්වතුන් හොඳට තේරුම් ගන්න දැන් මේ කථා කරන්නේ එක්තරා වීථි ක්‍රමයක් පිළිබඳවයි. මේ විසර්ජනා විස්තරයට බහින්න කලියෙන් අපි මූලික වශයෙන් ප්‍රත්‍යය ධර්ම 24 පිළිබඳව කථා කරගෙන සාකච්ඡා කරගෙන පැමිණියා බොහොම දුරක්. මේ විසර්ජනා වාර කථා කරන්න පළමුවෙන් ඒ ටික අපිට තිබෙන්න ඕන.

අපි පළමුවෙන්ම මූලික කරුණු සාකච්ඡා කළා. සිත කියන්නේ කුමක්ද? සිතට බැඳී සිතට එක්කාසු වී අංග උපාංග හැටියට ක්‍රියාත්මක වෙන්නා වූ චෛතසික ධර්ම පිළිබඳව කථා කළා. චිත්ත ධර්ම චෛතසික ධර්ම කියලා කියන්නේ මනසට සම්බන්ධ, මනසත් එක්ක, විඤ්ඤාණයත් එක්ක, හිතත් එක්ක පවතින ඒ නාම ධර්ම සමූහයක්. නාම ධර්ම නොවෙන ධර්මතා දෙකක් තිබෙනවා. එකක් තමයි ලෞකික වශයෙන් 'රූප ධර්ම' පිළිබඳව විස්තර විග්‍රහයක් ගෙන ආව. ඊළඟට 'නිර්වාණ ධාතුව' ලෝකයෙන් එතර වෙච්ච තැන. දැන් මේ ධර්ම කාණ්ඩය අපි විස්තර කරලා ඊට පස්සේ කථා කළා මතක ඇති, චිත්ත වීථි කියලා ජාතියක්. ඒ චිත්ත වීථි, අරමුණක් සම්බන්ධයෙන් කොහොමද හිත් පෙළක් යන්නේ කියලා. එතැන තිබෙනවා චිත්ත වීථි සම්බන්ධ කථාවක්. පංචද්වාරාවජ්ජන චිත්ත වීථි මනොද්වාරාවජ්ජන චිත්ත වීථි කියලා වර්ග දෙහෙකින් අපි කථා කළා. එහෙම චිත්ත වීථි ජාතියකුත් තිබෙනවා. හැබැයි මෙතැන සූවිසි පට්ඨානයේ ප්‍රත්‍යය ධර්ම 24 එක එකක් ගැන කථා කරගෙන ඇවිල්ලා දැන් වෙනත් වර්ගයක වීථි විග්‍රයක් තමයි මේ කරන්නේ. ඉතින් අපි 'හේතු ප්‍රත්‍යය' ධර්ම පිළිබඳව විසර්ජනා වාරයේදී ඒ වීථි කථා කළා. 'ආරම්මණ ප්‍රත්‍යය' ගැන කථා කළා. දැන් මේ 'අධිපති ප්‍රත්‍යය' ගැන කථා කරන්නේ.

මේ 'අධිපති ප්‍රත්‍යය' ගැන කථා කරනකොට අපේ පින්වතුන් හොඳට තේරුම් ගන්න මේ අධිපති බව කියන එකේ ආකාර දෙකක් තිබෙනවා. අධිපති බව අධිපතිත්වය යන මේ වචන ඇහෙනකොටම අපිට තේරෙනවා යම්කිසි leading part එකක් කරන ධර්මයක් කියලා. යම් කිසි බලවත් ධර්මයක් කියලා අදහසක්

එනවා. එතකොට මේ අධිපති ප්‍රත්‍යය ගැන කියන කොට අපි කරුණු දෙකක් තේරුම් ගන්න ඕන. එකක් තමයි අධිපති කම **'ආරම්මණයක්'** හැටියටත් එනවා. අනිත් එක **'සහජාත ධර්ම'** හැටියටත් අධිපති වෙනවා. අරමුණක් අධිපති වෙනකොට කියනවා **'ආරම්මණ අධිපති'** ස්වභාවය කියලා. තව තිබෙනවා **'සහජාත ධර්ම'**, ඒවා අධිපති වෙනවා වෙලාවකට. ඒක නිසා අපි තේරුම් ගන්න ඕනෑ අධිපති ප්‍රත්‍යයයේ තිබෙනවා **'ආරම්මණ අධිපති ස්වභාවය'** සහ **'සහජාත අධිපති ස්වභාවය'**.

මීට කලින් මම මේක විස්තර කළා නමුත් නැවත අහන්න. හේතුව, පිරිසිදු කමට පැහැදිලි අවබෝධයට ඒවාගේම කාරණය තව හොඳට විස්තාරව පෘතුලව තේරුම් ගන්න හොඳ පින්තූරයක් මේකෙන් අපිට හදලා දෙනවා. ආරම්මණ අධිපති කියලා කියන්නේ අපි පාරේ ඇවිදගෙන යනවා, අරමුණු ගොඩයි. අරමුණු ගොඩක් උනාට ඔක්කොම අරමුණු අධිපති වෙන්නේ නෑ. සමහර අරමුණු තිබෙනවා අපේ හිත ඒකට අද්දලා ගන්නවා. හිත විතරක් නොවෙයි. අපේ හිතයි චෛතසික ටිකයි ඔක්කොම ටික ඒ අරමුණට අද්දලා ගන්න පුළුවන් හැකියාවක්, මහා ගුණ ස්වභාවයක්, මහා ධර්ම හැකියා බලයක් ඒ අරමුණේ තිබෙනවා. ඒ ගතිය නිසා තමයි අපි ඒ අරමුණට ගලාගෙන පාත්වෙලා ඇදිලා යන්නේ. අපි හිතමු ගමනක් යනකොට මිනුස්සු ගොඩක් ඉන්නවා. ඔය මිනුස්සු වගේම කඩ පොළවල් තිබෙනවා. සාප්පු තිබෙනවා. ඒ වගේම බෝට්ටු තිබෙනවා. කන බොන මිනුස්සු ඉන්නවා. ඇවිදින මිනුස්සු ඉන්නවා. යාන වාහන තිබෙනවා. ඔය වගේ නොයෙක් විදියේ මල්, පැල, කොළ, ගොඩනැගිලි මහා ගොඩක් තිබෙනවා. ලොකු බිල්ඩින් තිබෙනවා. දිග පාරවල් තිබෙනවා. ඕවා අතර හැම අරමුණක්ම අපිට අධිපති වෙන්නේ නෑ. සමහර අරමුණු විතරක් අධිපති වෙනවා. පුරුෂයෙකුට නම් කාන්තා රූපයක් දකින්න ලැබෙනවා. එතකොට මේ පුරුෂයාගේ වෙන මොකක් හරි හිත හිතා ගිය හිත අර කාන්තා රූපයට ගිහිල්ලා ඒ පැත්තට නැමිලා ඒ පැත්තට ගලාගෙන ගිහිල්ලා ඒ පැත්තට නැඹුරු වෙලා හිතන්න පටන් ගන්නවා. 'කවුද මේ? මොනවාද කරන්නේ?' කියලා. එතකොට වෙන එකක් හිතමින් ගිය හිතට ඇයි මේ කාන්තා රූපය පිළිබඳව හිතන්න යොමු උනේ? ඒකෙ තිබෙනවා ආරම්මණ බලයක්, ආරම්මණ අධිපති කමක්. කාන්තාවක් යනවා. තව ගොඩක් කාන්තාවෝ ඉන්නවා. මේ යන කාන්තාවට දකින්න ලැබෙනවා පුරුෂ රූපයක්. වෙන වෙන දේවල් ගැන හිතාගෙන කල්පනා කරමින් ගිය මේ කාන්තා හිත සහ චෛතසික ධර්මයෝ ටික අර හිත හිත ගියා වූ දේවල් වලින් අයින්වෙලා ඉවත්වෙලා දැන් මේ පුරුෂ රූපය පිළිබඳව හිතන්න පටන් ගන්නවා. 'කවුද මේ?

මොනවාද කරන්නේ?' ඔහුගේ හැඩ රුව. අන්න එතකොට ඒ පුරුෂ රූපයට ඒ කාන්තාවගේ හිතේ චිත්ත චෛතසික ඔක්කෝම යටත් වෙලා ඇදිලා ගලාගෙන ගියා. එතකොට කාන්තා රූපය කෙනෙකුට **ආරම්මණ අධිපති** වෙනවා. පුරුෂ රූපය තවත් කෙනෙකුට **ආරම්මණ අධිපති** වෙනවා.

ඒවගේම අපි හිතමු, තියෙනවා ලස්සන බබලන දේවල්. සුදු පාටට බැබලෙනවා, නිල් පාටට බබලන දේවල් තිබෙනවා. ඔය අතර රත්තරන් වගේ දෙයක් බැබලෙන්න ගත්තයින් පස්සේ එතෙන්ට වැඩියෙන් හිතනවා. ඒ වගේම අපි park එහෙක යනකොට ඒකෙ තිබෙනවා හැදිච්ච දේවල්. කොළ, දළු, මල් . ඒ අතර මල් ටිකක් දැක්කයින් පස්සේ අපේ හිත අනිත් ගස් වලින් කොළ වලින් දළු වලින් අයින් වෙලා ඒ මල් පැත්තට යනවා. ඒ මලේ තිබෙනවා ආරම්මණ අධිපති ස්වභාවය. ඕක අපි තේරුම් ගන්න ඕනෑ. එතකොට මේ ලෝකයේ අරමුණු ගොඩාක් තිබෙනවා. ඒ අරමුණු ආරම්මණ අධිපති ශක්තිය තිබෙන්නාවූ අමුතු අරමුණු ටිකක්. ඒවාට හිත ගියාට පස්සේ ඒවා සම්බන්ධයෙන් අපේ හිත හිත හිතා යනවා. හිතනවා කියන්නේ හිතයි චෛතසික ටිකයි ඒ පැත්තට හැරිලා නැමිලා එක්කාසුවෙලා ක්‍රියාත්මක වෙනවා කියන එක. ඕන්න ඔය වැඩේදි **ආරම්මණ අධිපති** ස්වභාවය තිබෙනවා. ඔන්න එකක්. ඕකට කියනවා **ආරම්මණ අධිපති** බව කියලා.

තව එකක් තිබෙනවා, ඒ තමයි **සහජාත අධිපති** භාවය. සිතට අරමුණක් හැටියට ආපු දේ තමයි ඉස්සෙල්ලා කථා කළේ. සමහර අරමුණුවලත් තිබෙනවා අධිපති වැඩේ කරන්න පුළුවන් හැකියාව. එතකොට ඒක 'ආරම්මණ අධිපති'. දැන් මෙතන තිබෙන්නේ, අරමුණ හිතන 'හිත' ඇතුලෙත් තිබෙනවා අධිපති වැඩ කරන්න පුළුවන් යම් යම් ධර්ම. ඒ වගේම අරමුණක් ගැන හිතන කොට හිතන්නා වූ හිතෙත් තිබෙනවා අධිපති වැඩේ කරන්න පුළුවන් හැකියාව තිබෙන බලවත් දෙයක්. හිතත් එක්ක සහජාතව, හිතත් එක්ක එකට ඉපදී, හිතත් එක්ක උප්පත්තිය ලබාගෙන හැසිරෙන ඒවාට කියනවා 'සහජාත' එනම් 'එකට ඉපදී අධිපති කම් කරන්නාවූ ධර්ම' කියලා. ඒවගේ ධර්ම මහා ගොඩක් නෑ. ඒකත් තේරුම් ගන්න ඕන.

ආරම්මණ අධිපති පැත්තට ගියහම ලෝකයේ බලන්න අරමුණු තිබෙනවා, අහන්න අරමුණු තිබෙනවා, හිතන්න, ආස්වාදනය කරන්න ගොඩක් අරමුණු

තිබෙනවා. අතීත අනාගත වර්තමාන වශයෙන්. ඔය හැම එකකම ආරම්මණ අධිපති කරන්න පුළුවන් ඒවා අඩුයි. සමහර අරමුණු පමණක් අධිපති වෙනවා. ඒවගේ, අපේ තිබෙනවා චෛතසික 52, ලෞකික සිත් 81 , ලෝකෝත්තර සිත් 8 ක් තිබෙනවා. විස්තාර වශයෙන් 40 තිබෙනවා. ඒවගේම මේ ඔක්කෝටම අධිපති වැඩේ කරන්න බෑ. මේ චෛතසික ධර්ම වලින් මේ සිත් වලින් අධිපති හැකියාව තිබෙන්නාවූ ධර්ම තිබෙන්නේ 4 යි. ඒ හතර තමයි 'ඡන්දය' 'චිත්තය' 'වීරිය' 'විමංසාව'. ඔන්න බලන්න - 'ඡන්දය' කියන්නේ චෛතසික ධර්මයක්. ඕක අධිපති වැඩේ කරනවා. 'චිත්තය' කියන්නේ හිත. 'වීරිය' කියලා කියන්නේ වීර්‍ය චෛතසික ධර්මයක්. 'විමංසාව' කියලා කියන්නේ ප්‍රඥා චෛතසිකය. එතකොට චෛතසික ධර්ම තුනක් තිබෙනවා. 'ඡන්ද' 'වීරිය' 'විමංසාව' (ප්‍රඥාව) සහ අනිත් එක 'සිත'. මේ අරමුණ පැත්තට ගියා වූ ආරම්මණ අධිපති බවයි මේ ධර්ම හතර දෙනා ගැන කථා කරන එක තමයි මෙතන තිබෙන්නේ. දැන් මේ ටික මෙහෙම තේරුම් අරගෙන මේ වැඩේ සිද්ධ වෙන විදිය කියන්න තිබෙනවා, අධිපති ප්‍රත්‍යය යටතේ මේවා විසඳා දෙන තැනක්. ඒකට වීර්‍ය වාර කියලා කියනවා. විසර්ජනා වාර කියලත් කියනවා. විසර්ජනා කියලා කියන්නේ මේ අධිපති ප්‍රත්‍යය කථාව කොහොමද වෙන්නේ කියලා අපිට හොඳට පැහැදිලි කරලා දෙන විදිය. මේ යටතේ වීර්‍ය වාර තිබෙනවා 10 ක්. අපි මේ වීර්‍ය වාර දහය තේරුම් ගනිමු මෙහෙම. මේක තිබෙන්නේ මෙහමයි.

1. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති.**

මේකෙන් කියන්නේ, කුසල ධර්මය තවත් කුසල ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා අකාර දෙකකට. එකක් තමයි **ආරම්මණාධිපති** වෙනවා කියන එක. අනිත් එක තමයි **සහජාතාධිපති** වෙනවා. මේ දෙකෙන්ම අධිපති වෙනවා. හොඳට මතක් තබා ගන්න මෙහි මාතෘකාව. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස**, වචන තිබෙන්නේ එහෙමයි. දැන් මේ කියන්නනේ කුසල ධර්ම කථාවක්. කුසල ධර්මයක් කුසල ධර්මයකට අධිපති වෙනකොට අධිපති දෙන්නෙක් ඉන්නවා. 'ආරම්මණයත් අධිපති' වෙනවා 'සහජාත ධර්මත් අධිපති' වෙනවා. මේක තමයි පළවෙනි වීර්‍ය වාරය - පළවෙනි විසර්ජනාව.

2. **කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති =** කුසල ධර්මයක් අකුසල ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා - මෙතනදී තිබෙන්නේ **ආරම්මණ අධිපති** භාවය පමණයි. මේකේ සහජාත අධිපති කම නෑ.

3. **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති. =** කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතැනදී දෙකක් වෙනවා, **ආරම්මණ අධිපතිත්** වෙනවා **සහජාත ස්වභාවයෙන් අධිපතිත්** වෙනවා.

4. **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති =** කුසල ධර්මයක් කුසලයටයි අව්‍යාකෘතයටයි කියන ධර්මතා දෙකටම අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතන තිබෙන්නේ **එකයි**. ඒ තමයි සහජාත අධිපති ප්‍රත්‍යය.

දැන් එතකොට බලන්න මේ අධිපති භාවය දක්වන විසර්ජනා වීථි වාර කීයක් ආවද? 4යි. කුසල ධර්මය යටතේ, 'කුසලය කුසලයට ප්‍රත්‍යය වෙනවා' 'කුසලය අකුසලයට ප්‍රත්‍යය වෙනවා' 'කුසලය අව්‍යාකෘතයට ප්‍රත්‍යය වෙනවා' 'කුසලය කුසලයටයි අව්‍යාකෘතයටයි දෙකටම අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා' කියල 4 ක් ආව. එතකොට මේ විසර්ජනා වාර 10 න් තව 6 ක් තිබෙනවා. මේ පේළිය හොඳට මතක තබා ගන්න. මතක තියා ගත්තහම ඉස්සරහදි ගැට ලිහා ගන්න ලේසියි. අපි දැන් මේ බොහෝම සියුම් වූ දෙයක් තමයි මේ ඉගෙන ගන්නේ. ඒක තමයි හොඳටම තේරුම් ගන්න ඕනේ. දැන්, ඉර එළිය වැටෙනව. ඉර එළිය වැටෙන කොට අපි ඉර එළිය කියලා කියනවා. 'අව්ව වැටෙනවා' 'ඉර එළිය වැටෙනවා' සූර්ය ආලෝකය' කියලා හැමතැනම කියන්නේ 'එළිය' කථාව. ඒකෙ අස්සේ තිබෙනවා තව ජාතියක්. අපිත් සූර්යාට තැන දෙන්නේ ඒකෙ එළියට. හැබැයි ඒ එළිය අස්සේ තිබෙනවා රස්නේ ගතිය. සූර්යාගේ එළිය සහ රස්නේ දෙකම තිබෙනවා. ඒ විතරකුත් නොවෙයි. දැන් ඔය ඔස්ට්‍රේලියාවෙයි නවසීලන්තයෙයි දෙකේම තිබෙනවා, අපි ඒකට අකුරු දෙකක් පාවිච්චි කරනවා UV කියලා. Ultraviolet නම් වූ සමේ පිළිකා හැදෙන්න හේතු වෙන්නාවූ යම්කිසි කිරණ ස්වභාවයක් හිරු එළිය අස්සේ තිබෙනවලු. ඕක අපිට පෙන්නේ නෑ. අපි හැම වෙලාවේම බලන්නේ ලොකු කොටස විතරයි. ඉර එළිය ගැන හිතනවා ඒකෙ රස්නේ ගැන වැඩිය හිතන්නේ නැහැ. අපි ඒ ගැන දන්නවා හැබැයි Ultraviolet ගැන එහෙම හිතන්නේ නැහැ. ඒ උනාට ඒක තිබෙනවා.

ඔය වගේ ධර්මයක් අස්සේ හැංගිලා ඒවගේම සියුම්ව කැවිලා, ඒත් ක්‍රියාත්මක ස්වරූපයෙන් තිබෙන තැනක් ගැන තමයි මේ කථා කරන්නේ. ඒක නිසා සූත්‍ර

දේශනාවක වගේ නොවෙයි මේක අස්සේ හරි ගාම්භීරත්වයක් තිබෙනවා. මේ Ultraviolet හොයන්න වගේම තමයි මේකත් තිබෙන්නේ. හැබැයි නැත්තේ නෑ, තිබෙනවා. තථාගතයන් වහන්සේගේ නුවණ ඔය අස්සේ රිංගලා තිබෙනවා. දැන් අපි කුසල ධර්ම යටතේ පේළි හතරක් කිව්වා. දැන් බලමු අනිත් පේළි කොහොමද යන්නේ කියලා. දැන් දෙවෙනි කොටස.

5. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති** = අකුසල ධර්ම කියන්නේ අකුසල චිත්ත චෛතසික ධර්ම. මෙතැනදී අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතැනදී කරුණු දෙකක් තිබෙනවා. ආරම්මණත් වෙනවා සහජාතත් වෙනවා.

6. **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති =** අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අධිපති වෙනවා. මෙතැන තිබෙන්නේ **සහජාත අධිපති** භාවය පමණයි.

7. **අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො. සහජාතාධිපති =** මෙතැන තිබෙන්නේ සහජාත අධිපති පමණයි.

දැන් එතකොට අකුසල ධර්ම යටතේ අකුසලය අකුසලයට ප්‍රත්‍යය වෙනවා. අකුසලය අව්‍යාකෘතයට ප්‍රත්‍යය වෙනවා. අකුසලය අකුසලයටත් අව්‍යාකෘතයටත් ප්‍රත්‍යය වෙනවා. දැන් මෙතන තිබෙනවා වීථි වාර 7 ක්. ඊළඟට අව්‍යාකෘත යටතේ තිබෙනවා තව වීථි වාර තුනක්.

8. **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති** = මෙතැනදී අව්‍යාකෘතයක් අව්‍යාකෘතයකටම අධිපති වෙනවා, ආරම්මණ වශයෙන් සහජාත වශයෙන්.

9. **අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති** = අව්‍යාකෘත ධර්මයක් කුසල ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. එතනදී ආරම්මණ අධිපති භාවයෙන් පමණයි අධිපති වෙන්නේ.

10. **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො.**
**ආරම්මණාධිපති** = අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතනත් තිබෙන්නේ **ආරම්මණාධිපති** භාවය පමණයි.

මේ විදියට තිබෙනවා වීථි 10 ක්. මේකට කියනවා විසර්ජනා වාර - වීථි වාර දහය කියලා. මේක සමහර තැන්වලදී සජ්ඣායනා කරනවා. මේකට තිබෙනවා සජ්ඣායනා කරන්න පිළිවෙලක්. දැන් මම මේ වෙනකොට කියලා දුන්නා **ආරම්මණයක් අධිපති** වෙන්නේ කොහොමද, **සහජාත ධර්මයක්** (ඡන්ද චිත්ත වීරිය විමංසා) අධිපති වෙන්නේ කොහොමද කියලා. දැන් තිබෙන්නේ ඒක වෙන විදිය පිළිබඳව කියන්න. මම ගිය සතියේ ඔය පිළිබඳව ටිකක් කියලා දුන්නා. මම හිතන්නේ වීථි හතරක් ගියා කියලයි මගේ මතකය.

හොඳට බලන්න 5 වෙනි වීථි වාරය. අකුසල ධර්මය අකුසල ධර්මයට අධිපති වෙනවා. 'සහජාත අධිපතිත්' වෙනවා 'ආරම්මණ අධිපතිත්' වෙනවා. මෙතන ප්‍රත්‍යය ශක්ති දෙකක්. මේක වෙන විදියත් අපි හිතලා බලමු. තව එකක් දැනගත යුතුයි. මේකේ තිබෙනවා ප්‍රත්‍යය ශක්ති. ප්‍රත්‍යය ශක්තිය නැත්නම් මේක කරන්න බෑ. දැන් මලක් කියන්නේ අරමුණක්. ඒක ආරම්මණ අධිපති වෙනවා නමුත් ආරම්මණ අධිපති වෙන්නේ ඒ මලේ තිබෙනවා අපිට පේන්නේ නැති මනින්න බැරි අමුතු විදියේ හැංගිච්ච ගුණ ශක්ති විශේෂයෙක්. ආරම්මණ ශක්ති බලයක් ඒ මලේ තිබෙනවා. ඒක මීටරේකින් මනින්න පුළුවන් එකක් නොවෙයි. ඒ ශක්තිය තිබෙන හින්ද තමයි අපේ හිත ඒකට අද්දන්නේ. කාන්තා රූපයේ තිබෙනවා යම් කිසි අමුතු බලයක් හැකියාවක් ශක්තියක් යම් කිසි කෙනෙකුගේ හිත ඒ පැත්තට නම්ම ගන්න, අද්ද ගන්න. ඕක කිච්චහම දැන් කෙනෙක් හිතන්න පුළුවන් ඒ කාන්තා ස්වරූපය තිබෙන්නේ පුරුෂ හිතක් නම්ම ගැනීමට අද්දා ගැනීමට විතරයි කියලා. එහෙම හිතන එක ධර්මානුකූලව වැරදියි. හේතුව, කාන්තාවෝ කාන්තාවන්ගේ හිත්ම ගන්නවා. කවුරුහරි කෙනෙක් යම් කිසි ඇඳුමක් ඇඳගෙන ගියොත් එහෙම පිරිමින්ට වඩා බලන්නේ කාන්තාවෝ. හේතුව, කාන්තාවගේ තිබෙනවා යම් කිසි බල විශේෂයක් ඒ ඇඳුමේ ඒ රූපයේ අර අනිත් කාන්තාවන්ගේ හිත් ටික ඔක්කොම ඒ පැත්තට ඇද ගන්න. එතැනදී තිබෙනවා බලයක්, ඒකට කියනවා ආරම්මණයේ තිබෙන 'ප්‍රත්‍යය ශක්තිය' කියලා. ඕක මේ කාන්තාවන්ගේ වරදක්වත් පුරුෂයන්ගේ වරදක්වත් බලන අයගේ වරදක්වත් එහෙම නොවෙයි.

මේ ධර්ම කථාව කරනකොට පුද්ගලයෝ උස් පහත් කරලා ඒවාගේම ‘මගේ’ ‘අපේ’ ‘අරයගෙ’ ‘මෙයාගේ’ කියලා වර්ග කරන්නේ නැතුව කෙනෙකුට අයිති කරන්නේ නැතුව තමන්ට අයිති කරගන්නෙත් නැතුව ධර්ම ශක්තිය විතරක් හිතන්න ඕන. මේක ලෝකස්වභාවයක්. මේක අපි කාටවත් අයිති නැතුව, අපිත් මේ ලෝකයට අයිති නැතුව, අපිත් අපිට අයිති නැතුව මේ ලෝකයට ඉපදිලා තිබෙනවා, ඉඳලා තිබෙනවා, ඉඳලා අපි යනවා. එතකොට අනෙක් කෙනෙක් එහෙම වෙන්න බැනේ. ඒක නිසා මේවා ස්වභාව ධර්මයේ තිබෙන දේවල්. මේවා ධර්ම ස්වභාව. කාගෙවත් වරදක්වත් වැඩිපුර හොඳක්වත් නොවෙයි. මේක ධර්ම ස්වභාවයක්. ඒක නිසා ආරම්මණයේ ප්‍රත්‍යය ශක්තියක් තිබෙනවා. ඒවගේම තමයි සහජාත ධර්ම වලත් තිබෙනවා අධිපති ප්‍රත්‍යය ශක්තියක්. ඒ කියන්නේ ඡන්දයේ තිබෙනවා අධිපති ප්‍රත්‍යය ශක්තියක්. චිත්තයේ තිබෙනවා අධිපති ප්‍රත්‍යය ශක්තියක්. අනිත් ඒවාට නැති හැකියාවක් තිබෙනවා. වීරියේ තිබෙනවා අධිපති ප්‍රත්‍යය ශක්තියක්. ප්‍රඥාවේ තිබෙනවා අධිපති ප්‍රත්‍යය ශක්තියක්.

1. හොඳයි, නැවතත් පළවෙනි වීථි වාරය හිතන්න - **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති** - කියලා කිව්වා. එතැනදී ආරම්මණාධිපතිත් වෙනවා, සහජාතාධිපතිත් වෙනවා.

2. දැන් අපි හිතමු **කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො ආරම්මණාධිපති** – කියන තැන ආරම්මණාධිපති භාවය විතරයි තිබෙන්නේ. එතැන තිබෙන්නේ ආරම්මණ කථාව විතරයි. අපි ඒ ටික සලකා බලමු මෙහෙම. මේකේ සිංහල තේරුම ගන්නේ මෙහෙමයි - කුසල ධර්මයක් කියන්නේ හොඳ එකක්. මේ හොඳ ධර්මයක් අකුසල ධර්මයකට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ. ඒක වෙන්නෙත් ආරම්මණාධිපති භාවයට. අපි බලමු ඔය කථාව වෙන්නේ කොහොමද කියලා. ඕක විස්තර කරනකොට තිබෙන්නේ පට්ඨානයේ - **‘දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති’** යනුවෙන් විස්තරයක්.

හොඳට බලන්න **'දානං දත්වා' -** දානය කියන්නේ මොකක්ද? අපි සාමාන්‍ය තැනක කථා කරන දේ නොවෙයි මෙතන දානය කියලා කියන්නේ. 'දානං දත්වා' - අපි දානයක් දුන්නා කියලා කියන්නේ ආහාර පාන, මාළුපිණි වර්ග, කැවිලි පෙවිලි වර්ග, සිවුරු පිරිකර වලට තමයි අපි දානේ බෙදන්න දානේ පූජා කරන්න කියලා කියන්නේ. නමුත් මේ කථාවේ දානය කියලා කියන්නේ එහෙම නොවෙයි. **'දානං දත්වා'** කියන තැන ක්‍රියාව එහෙම උනාට, වස්තුව එහෙම උනාට හිතේ අලෝභී චේතනාව සහ එයට සම්බන්ධ චෛතසික ධර්ම ගැන තමයි මෙතන කථා කරන්නේ. ඒ කියන්නේ කාමාවචර කුසල් සිත්. **'සීලං සමාදියිත්වා'** කියන කොටත් අපි කියන ශබ්දයත් වාක්‍යය ටිකත් ශික්ෂාපද ටිකත් නොවෙයි, ඒවා ක්‍රියාත්මක කරන්න සමාදන් වෙන්න යොදපු චිත්ත චෛතසික ටික තමයි මෙතනින් ගන්නේ. ඒ කියන්නේ කුසල චේතනා, කාමාවචර කුසල් සිත්. **'උපොසථකම්මං කත්වා'** = කාමාවචර කුසල් සිත්.

දැන් පින් කරලා ඉවරයි. දානෙත් දීලා හොඳ කාමාවචර සිත් පහළ කරගෙන ඊට පස්සේ පන්සිල් සමාදන් වෙලා, අටසිල් සමාදන් වෙලා, ආජීව අට්ඨමක සීලය සමාදන් වෙලා දැන් කුසල් සිත් පහළ උනා. **'උපොසථකම්මං කත්වා'** = ඒ කියන්නේ පුර පසළොස්වක පෝය දවසේ හොඳට සිල් සමාදන් වෙලා හොඳ පින් සිත් ඇති උනා. දානෙත් දීලා සිලුත් අරගෙන උපෝසථ කම්ම කරගෙන දැන් ගෙදරට එනවා. පින් කරලා ඉවර වෙලා කුසල් වඩලා ඉවරවෙලා ඒ කරපු දේ ගැන, දීපු දානය ගැන ගිය වන්දනාව ගැන **'තං ගරුං කත්වා'** = ඉතාම උතුම් දෙයක් කියලා ඇලීම් වශයෙන් ආසවාදනය කරනවා. ලෝභ සිත් උපදවනවා. ඒවාගේම ඒ ගැන කැමති වෙනවා. ඒ කාමාවචර පරිත්‍යාග චේතනාව පිළිබඳව පුදුම විදියට ගරු කර කර රස විඳිනවා. ඒ වාගේම සතුටු සහගත, තණ්හාව මුල් වෙච්ච, ප්‍රීතිය මුල් වෙච්ච චිත්තයක් ඇතිවෙනවා. ඒ කියන්නේ ලෝභ මූල සිත් ඇතිවෙන්නේ. කවදාකවත් කරපු පිනට එහෙම තරහ ඇතිකරගන්නේ නෑනේ. ඒකට ඇතිවෙන්නේ ලෝභ කරන සිත්. 'මම මෙහෙම කළා, මෙහෙම කළා' කියලා කරපු පින පිළිබඳව ලෝභ සිත් පහළ වෙනවා, ඒ කරපු සීලය පිළිබඳව, කුසල් චේතනාවල් පිළිබඳව අමුතු විදියේ හරි සතුටක් ඇතිවෙනවා. පින් සිතෙනුත් පින් සිත උපදවන්න පුළුවන්. පින් සිතෙනුත් පින් සිත අරමුණු කරන්න පුළුවන්. පවු සිතෙනුත් පින් සිත අරමුණු කරන්න පුළුවන්. මෙතැන තිබෙන්නේ පවු සිතෙන් එනම් අකුසල් සිතෙන් පින අරමුණු කරන විදිය. එතකොට **'රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති'** දැන් මේක මෙහෙම කිවවහම 'එහෙම නම් අපිට පිනක් කරන්න බෑනේ' කියලා දෘෂ්ඨි වශයෙන් ගන්න එපා. මේකේ තිබෙන ධර්ම ස්වභාවය තේරුම් ගන්න.

සාමාන්‍යයෙන් පෘතක්ජන මිනුස්සුන්ට එහෙම හිතෙනවා. හිතුනට මේකේ තිබෙන්නේ මේ වගේ ධර්ම ස්වභාවයක් කියන එක තමයි මෙතැන කියන්නේ.

ඊළඟට 'මම පින් කළා' 'මම කුසල් කළා' කියලා පින පිළිබඳව දෘෂ්ඨිය දාගන්නවා. අනිත් එක තමයි 'මගේ පිනක්' කියලා දාගන්නවා. ආන්න ඒ වගේ දෘෂ්ඨි හිත හදාගන්න, ඇලීම ලෝභය හදා ගන්න ඒ ගැන තණ්හාවෙන් සතුටු වෙන්න තියෙන්නේ මොකක් ගැනද? අර කරපු පින, අර කරපු කුසලය. ආන්න එතැනදී සිද්ධ වෙනවා කුසල ධර්මය අකුසල ධර්මයන්ට අරමුණක් හැටියට අධිපති වෙනවා. අන්න ඒ කථාව තමයි මේ කියන්නේ.

දැන් එතකොට මෙතන තිබෙනවා ලෞකික වශයෙන් කුසල් සිත් 17. කුසල් සිත් ඔක්කොම 21 තිබෙනවා. ඒ කුසල් සිත් 21, හොඳට තේරුම් ගන්න. කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර ධ්‍යාන සිත් 5 + අරූපාවචර සිත් 4 = 17 + ලෝකෝත්තර සිත් 4 = 21 ඒකෙන් ලෝභයට අහුවෙන්නේ සිත් 17 විතරයි. ලෞකික වශයෙන් තිබෙන කුසල් සිත් විතරයි. ලෝකෝත්තර කුසල් සිත්වලට ලෝභ කරන්න බැහැ. ඒවා අහුවෙන්නේ නෑ මේ ලෝකෝත්තර සිත් වලට. එහෙ යන්න බෑ. ඒක නිසා ඔය විදියට තමන් ධ්‍යානයකයට ගියත් ඔය විදියට තිබෙනවා. අපි ඉස්සරහදි ඒ ගැන කථා කරමු.

තව එකක් තිබෙනවා. **'පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති'** = ඉසෙල්ලා ගිහිපු නොයෙක් වන්දනා ගමන්, අනිත් අයට උදව් උපකාර කරපු දේවල්, දෙමව්පියන්ට ඇප උපස්ථාන කරපු දේවල් අම්ම තාත්තා නාවපු හැටි, කන්න දීපු හැටි, ඇඳුම් පැලඳුම් දීපු හැටි ආදී දේ . **'පුබ්බෙ සුචිණ්ණානි'** = හොඳ දේවල්, මොනවා හරි කමක් නෑ, මලක් පහනකට අත ගැහුවනම් ඒත් කමක් නෑ. **'තං ගරුං කත්වා'** = ඒක ගරුකරලා රාගය, ඇලීම, ලෝභය, දිට්ඨිය උපදිනවා. ඒ ඇති වෙන්නේ මොනවාද? අර ලෝභ සිත් වල පහළ වෙන චෛතසික ධර්ම තමයි මේ කියන්නේ. **සෝමනස්ස සහගතයි දිට්ඨිගත සම්ප්‍රයුක්තයි**. ඔය සිත් තමයි පහළ වෙන්නේ. මේ සිත් පහළ වෙන්න **'ආරම්මණ අධිපතිකම'** තමයි මෙතැන තිබෙන්නේ. ආරම්මණ භාවයෙන් අධිපති වෙනවා. එතකොට ඉස්සෙල්ලා කරපු දේවල් තමයි මෙතෙන්ට අරමුණු වෙන්නේ.

ඒකෙ තව පේළියක් තිබෙනවා මෙහෙම - **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති** = දැන් කාලේ මේක ගොඩක් තිබෙනවා. ඣානා වුට්ඨහිත්වා = හිත ධ්‍යානයකට පත්වෙලා නැගිට්ටට පස්සේ තමන්ගේ හිතට වෙච්ච දේ පිළිබඳ හරියට රහකර කර, රහ කරකර 'මගේ ධ්‍යානය, බොහොම හොඳයි, මට මෙහෙම ධ්‍යානයක් පහළ උනා' කියලා චිත්ත ඒකාග්‍රතා මාත්‍රයෙන් ඒකට ඇලෙනවා, මගේ ධ්‍යානය කියලා දැන් ඕක ජනප්‍රියයි. මේ වාක්‍ය - **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති** - දැන් මිනුස්සු ඕක මයික් අරන් කියන්නේ. 'මට මෙහෙම උනා මෙහෙම උනා පළවෙනි ධ්‍යානය දෙවෙනි ධ්‍යානය තුන්වෙනි ධ්‍යානය ආව silence උනා' කියල.

මෙතන තිබෙන මේ වීර්‍ය කථා කරන්නේ නම් ඇත්තටම **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා** කියලා නමුත් සමහර වෙලාවට ධ්‍යාන හැටියට රැවටිච්ච තැන් ගොඩක් තිබෙනවා. ඒ කියන්නේ ඔය වැඩ සටහන් වලට යනකොටත් පොඩි වෙලාවකට හිත නිසොල්මන් වෙන තැන් තිබෙනවා. ඒවා සමහර වෙලාවට වරදවා ගන්නවා. එහෙම අවස්ථාවන් තිබෙනවා. මෙතනදී නම් කියන්නේ ඇත්තටම ධ්‍යානයෙන් නැගිට්ට පස්සේ ඒකට ඇලෙන තාලේ. ඊළඟට ඒක අරමුණක් හැටියට අරගෙන එතැනදී තදබල විදියට ඒකෙ දෘෂ්ඨිගත වෙනවා, ඇලෙනවා. ඔන්න ඔය ස්වභාවය ගැන හිතන කොට අපිට කරුණු තුනක් ඉස්සෙල්ලා දෙනවා මේකෙන්. 'දාන සීල උපෝසථකම්ම' 'පෙර කරපු හොඳ දේවල්' සහ 'ධ්‍යානයකින් නැගිට්ටයින් පස්සේ ඒකෙන් ඇතිවෙන දේ'. ඔය වගේ කරුණු තුනක් දෙනවා.

මෙතැනදී අපේ මේ අහගෙන ඉන්න පින්වතුන්ට ධ්‍යාන ලැබෙන එක ගැන අපි හරිම කැමතියි, මොන භාවනා ක්‍රමයකින් හරි. ඒවගේම හිත සමාධි වෙනවා කියන එකට හරිම කැමතියි. ජීවිතේ පිනෙන් පිරෙනවා කුසලයෙන් වැඩෙනවා කියන එකට හරිම කැමතියි. හැබැයි කුසලය සම්බන්ධයෙන් කුසල නාමයෙන් අපි අකැමති දේකුත් තිබෙනවා. ඒ තමයි ධ්‍යාන ලබන්නේ නැතුව ධ්‍යාන ලැබුවාය කියලා රැවටෙනවාට අකමැතියි. නොලබපු ධ්‍යාන තත්ව ධ්‍යාන නමින් නම් කර කර ලෝකයේ තැන් තැන් වල කියා පාන එක ශිෂ්ටසම්පන්න ආර්ය ගුණ නියම විදියට තිබෙන අයට ගැලපෙන දේවල් නොවෙයි. ඒවා දෘෂ්ඨි වැඩි හින්ද ආත්ම සංඥා වැඩි හින්දා ආත්ම සංඥාව තමන් ගැනම විවරණ

කරමින්, ඒවාගේම උසස් කොට සලකමින් තමන්ගේ ආත්ම දෘෂ්ඨියේම තරවෙලා, ඒක ධ්‍යාන නමකට ඇඳවලා ලෝකයට මයික් එකකින් කියා පාන්න යන්න හොඳ නෑ. ලෝකෝත්තර ධර්ම කියලා කියන්නේ උත්තරිමනුස්ස ධර්ම. ලෝකෝත්තර ධර්මත් උත්තරිමනුස්ස ධර්ම තමයි. තවත් මේ පින්වතුන් දැන ගත යුතු වචනයක් තිබෙනවා. මටත් මේ මතකයට එන එන ඒවා කියනවා. ලෝකෝත්තර ධර්මයි උත්තරිමනුස්ස ධර්මයි කියලා තිබෙනවා. මේ උත්තරිමනුස්ස ධර්ම කියලා ගත්තම පළවෙනි ධ්‍යානයේ පටන් ඔක්කොම ධ්‍යාන එනම් දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි ධ්‍යාන, රූපාවචර ධ්‍යාන හතර සහ පහ, අරූපාවචර ධ්‍යාන ඔක්කොම උත්තරිමනුස්ස ධර්ම. තවත් සෝවාන් මාර්ග ඵල, සකෘදාගාමී මාර්ග ඵල, අනාගාමී මාර්ග ඵල, අරිහත් මාර්ග ඵල යන මේ ඔක්කෝම යන්නේ උත්තරිමනුස්ස හැටියට. පළවෙනි ධ්‍යානයේ ඉඳල ඉහළටම අරිහත් මාර්ග ඵල දක්වා යන්නේ උත්තරිමනුස්ස ධර්ම කියලා. හැබැයි මේ ඔක්කොම උත්තරිමනුස්ස ධර්ම උනාට ඔක්කොම ලෝකෝත්තර ධර්ම නොවෙයි. ඒකත් පටලවා ගන්න හොඳ නෑ. උත්තරිමනුස්ස ධර්ම කියලා කියපු ගමන් අපිට තේරෙන්න ඕනෑ, අපිට වැටහෙන්න ඕනෑ, අදහස් වෙන්න ඕනෑ උත්තරිමනුස්ස ධර්ම කියලා කියන්නේ පළවෙනි ධ්‍යානයේ පටන් රහත් මාර්ග ඵල ඔක්කොම ටික දක්වා කියලා. අනිත් එක තමයි ලෝකෝත්තර ධර්ම කියලා කිව්වයින් පස්සේ නම් හොඳට පැහැදිලිව තිබෙන්න ඕනේ සෝවාන් මාර්ග ඵල, සකෘදාගාමී මාර්ග ඵල, අනාගාමී මාර් ඵල, අරිහත් මාර් ඵල කියලා. බුදුරජාණන්වහන්සේ අපිට පැනවීමක් කරනවා ලෝකෝත්තර ධර්ම කියාපාන එක නොවෙයි උත්තරිමනුස්ස ධර්ම ගැන කියා පාන එක නවත්තන්න කියලා. එතකොට අර ටිකත් එකතු වෙනවනේ. ඉතින් අපේ මේ පින්වතුන්ට ධ්‍යාන ලැබෙනවට කැමතියි, ධ්‍යාන නමින් බොරුවට රැවටෙනවට අකමැතියි. ඒක නිසා, ඒක තිබෙනවා නම් පැහැදිලි කරගන්න තමයි මේකත් මේ පොඩි ආධාර කොටසක් හැටියට කියලා දුන්නේ.

3. ඊළඟට යමු තුන් වෙනි වීථියට. ඒකෙ තිබෙන්නේ මෙහෙමයි. **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති. ආරම්මණාධිපති – අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛති. සහජාතාධිපති – කුසලාධිපති චිත්තසමුට්ඨානානං රූපානං අධිපතිපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා. එතන

**'ආරම්මණ අධිපති'** ස්වභාවයත් තිබෙනවා **'සහජාත අධිපති'** ස්වභාවයත් තිබෙනවා. ආරම්මණ අධිපති කියලා කිව්වහම ඒක බර අරමුණ පැත්තට. සහජාත අධිපති කියලා කිව්වහම හිත පැත්තට බරයි. එතකොට තමන් හිතන හිත පැත්තෙත් තිබෙනවා අධිපති කම. අරමුණ පැත්තෙත් තිබෙනවා අධිපති කම. දෙපැත්තකින්ම අධිපති වෙනවා. හේතුව දෙපැත්තකින්ම අධිපති වෙන්න පුළුවන් හැකියාව තිබෙනවා.

ඒක මෙහෙමයි වෙන්නේ. අව්‍යාකෘත ධර්මවලට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවෙනවා. මොනවාද මේ අව්‍යාකෘත ධර්ම? ඒ තමයි රහතන්වහන්සේලාට පහළ වෙන්නාවූ සිත්. ඒ ධර්ම අව්‍යාකෘතයි. එතකොට රහතන් වහන්සේලාට පහළ වෙනවා ක්‍රියා සිත්. මේ ක්‍රියා සිත් පිළිබඳව විස්තරයක් කරන්නත් කියලා අපිට සමහර තැන් වලදී ආරාධනාවක් ඇවිල්ලත් තිබෙනවා. කුසල සිත් තිබෙනවා. ඒවාට කියනවා කුසල ධර්ම කියලා. අකුසල සිත් තිබෙනවා. ඒවාට කියනවා අකුසල ධර්ම කියලා. කුසලත් නොවෙන්නා වූ අකුසලත් නොවෙන්නා වූ ධර්ම තිබෙනවා. ඒවාට කියනවා ක්‍රියා සිත් කියලා. මේක අපේ පින්වතුන් අහලා තිබෙනවා. මමත් දේශනා කරලා තිබෙනවා. ඒ උනත් තවත් ටිකක් මේක නැවත හිතේ මතු පිටට ගන්න එක හොඳයි.

- කුසල සිත් කියලා කියන්නේ, මේ වෙලාවේ හොඳ හිතක් පහළ වෙනවා ඒකෙ විපාකයක් ඉස්සරහදි උපදවන්න පුළුවන් හැකියාවක් තිබෙනවා මේ හිතේ. ඉස්සරහදි **'කුසල විපාකයක්'** හදන්න පුළුවන් හැකියාව තිබෙන හිත් වලට තමයි කියන්නේ **'කුසල ධම්ම'** කියලා. කුසල ධම්ම කියලා කියන්නනේ ඒ හිතයි චෛතසික ටිකයි ඔක්කොම.

- අකුසල ධර්ම කියලා කියන්නේ, මෙතනදී අකුසල හිතක් පහළ වෙනවා අනාගතයේදී ඒකට සමාන අකුසල විපාකයක් හදලා දෙන්න පුළුවන් ගතිය තිබෙනවා. හැබැයි අකුසල විපාකය අකුසල හිතක් නොවෙයි. විපාකයක් හදන්න පුළුවන් ශක්තිය තිබෙන අකුසල හිතටත් චෛතසික ධර්ම ටිකටයි තමයි කියන්නේ අකුසල ධම්ම කියලා. හැබැයි එකෙන් හදලා දෙන විපාකය කුසලයකුත් නොවෙයි අකුසලයකුත් නොවෙයි.

- කුසලයෙන් හදලා දෙන විපාකය කුසලයක් නොවෙයි. අකුසලයෙන් හදලා දෙන විපාකය අකුසලයක් නොවෙයි. හේතුව, ඒකට මෙතැනදී මේ කථාවේදී පාවිච්චි කරනවා වචනයක් අව්‍යාකෘත ධර්ම කියලා. ඒකෙ තිබෙනවා

වර්ග දෙකක්. එකක් තමයි විපාකයටත් කියනවා අව්‍යාකෘතය කියලා, ක්‍රියාවටත් කියනවා අව්‍යාකෘතය කියලා - 'විපාක අව්‍යාකෘතය' 'ක්‍රියා අව්‍යාකෘතය' - ඊළඟට රූප ධර්ම වලටත් කියනවා අව්‍යාකෘතය කියලා. රූප කියන ඒවා කුසල සිත් කියලා කියන ජාතියක් නොවෙයි. රහතන්වහන්සේලාගේ හිත් වලටත් කියනවා ක්‍රියා සිත් කියලා ඒවාගේම කියනවා අව්‍යාකෘතයි කියලා. නිර්වාණ ධාතුවටත් කියනවා අව්‍යාකෘතයක් කියලා. එතකොට නිර්වාණ ධාතුව අව්‍යාකෘතයක්. ඕක එක එක්කෙනා තමන්ගේ තිබෙන්නා වූ දෘෂ්ඨි දාගෙන නොදන්නා කමට එක එක දේවල් ප්‍රකාශ කරාට මේ ධර්ම අපේ ආචාර්යන්වහන්සේලා ඒ රහතන්වහන්සේලා මේ පැටලුම් සහගත හිත්වල දෘෂ්ඨි නිරාකරණය කරගැනීමට දේශනා කරපු විදියක් තිබෙනවා. ඒකයි මේ කියන්නේ. අපේ උතුම් ගුණ ඇති ශ්‍රේෂ්ට ගුණ ඇති නිරවුල් වූ සන්තාන ඇති කෙලෙසුන්ගෙන් මිදී ගියාවූ සිත් ඇති උත්තමයන් වහන්සේලා මේක නිරවුල් කරලා බාල අයගේ හිත් වලට ඥානවන්ත භාවයට පත්වෙන්න දේශනා කරනවා මේ විදියට. විපාක අව්‍යාකෘතයක් තිබෙනවා ක්‍රියා සිත් හැටියට අව්‍යාකෘතයක් තිබෙනවා. රූප හැටියට අව්‍යාකෘතයක් තිබෙනවා. නිර්වාණය හැටියට අව්‍යාකෘතයක් තිබෙනවා. අව්‍යාකෘත ගොඩේ 4 ක් තිබෙනවා.

එතකොට අපි මෙතැන මේ විදියට තේරුම් ගනිමු. **අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛති.** රහතන්වහන්සේ මාර්ගයට පත්වෙලා ඊළඟට ඵලයට පත්වෙනවා. මාර්ග සිත අතීතයට ගියා. ඒකට අරමුණු උනේ නිර්වාණයයි. රහතන්වහන්සේ ඒ මාර්ගය හරහා එතනින් රහත් භාවයට පත්වෙලා ඊට පස්සේ ඒ රහතන්වහන්සේට පහළ වෙනවා සාමාන්‍ය සිත්. ඒ කියන්නේ කාමාවචර භූමියේ පහළ වෙන ඥාන සම්ප්‍රයුක්ත සිත්. ඒ හිතකින් රහතන්වහන්සේ මෙනෙහි කරනවා තමන් ඉස්සර වෙලා නිවන් දැකපු හිත. එතකොට ඒ 'හිතට' මෙනෙහි වෙන්නේ 'මාර්ග සිත'. මෙතනදී කියවෙන්නේ අව්‍යාකෘතයකට අරමුණු වෙන විදිය.

'සහජාත' කියලා කියන්නේ රහතන්වහන්සේගේ හිතේ තිබෙනවා ඡන්ද චිත්ත වීරිය විමංසා. ඒවත් එතෙන්ට එනකොට සහජාත වෙනවා. ආරම්මණ හැටියට ගන්න කොට අරමුණ ආරම්මණය වෙනවා. ඔන්න එකක්. ඥාන සම්ප්‍රයුක්ත සිත්වලින් තමයි මේක වෙන්නේ. මෙතැන තිබෙන්නේ ක්‍රියා අව්‍යාකෘත සිත්. මෙහිදී 'ආරම්මණය' 'අව්‍යාකෘත' වෙන්නේ රහතන්වහන්සේලාට අරමුණු වෙන

දේවල් උන්වහන්සේලා 'මගේ' කියලා ගන්නේ නෑ. නමුත් ධර්මයක් හැටියට විතරක් ආරම්මණ ප්‍රත්‍යය ස්වභාවය තිබෙනවා.

තව එකක් තිබෙනවා මෙහෙම. **'කුසලාධිපති චිත්තසමුට්ඨානානං රූපානං අධිපතිපච්චයෙන පච්චයො'** කියලා විග්‍රහයක් දක්වලා තිබෙනවා. එතකොට මේ චිත්තසමුට්ඨානික රූප තිබෙන්නේ කොහෙද? චිත්තසමුට්ඨානික රූප තිබෙන්නේ චෝකාර භවවල. ඒ කියන්නේ රූප තිබෙන තැන් වල. එහි සකන්ධ 5 තිබෙන්න ඕන. රූපය තිබෙන්න ඕන, වේදනා සංඥා සංඛාර විඤ්ඤාණය තියෙන්න ඕනෙ. නාම රූප දෙකම තිබෙන තැන්වල තමයි චිත්තසමුට්ඨානික රූප හැදෙන්නේ. රූපාවචර බ්‍රහ්මලෝකයේ, මනුස්ස ලෝකයේ ආදී ස්ථානවල. එතකොට ඒ අවස්ථාවේදී මහා කුසල් හැටියට පහළ වෙන්නා වූ සිත්වල ඒවාගේම ධ්‍යාන සිත්වල දී ඒ සිතුත් සමග පහළ වෙනවා චිත්තජ රූප. ඒ කුසල් සිත් නිසා පහළ වෙන්නාවූ රූප සම්පත්තියක් තිබෙනවා. ඒවාට අධිපති වෙනවා අර කියන්නාවූ කුසල් සිත ටික. ඒක තමයි **කුසලාධිපති චිත්තසමුට්ඨානානං රූපානං අධිපතිපච්චයෙන පච්චයො** කියන පැහැදිලි කිරීම සිද්ධ කරලා තිබෙන්නේ.

දැන් තුන්වෙනි වීථිය ගැන කිව්වා. ඒ කුසල ධර්මයක් කොහොමද අව්‍යාකෘත ධර්මයකට අධිපති වෙන්නේ කියලා. දැන් අපි තව එහෙකට යමු.

**4. කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති – කුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො** = දැන් මේ කුසල ධර්මය 'කුසලයටයි' 'අව්‍යාකෘතයටයි' දෙකටම අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතන 'සහජාත' අධිපති භාවයෙන් පමණයි ප්‍රත්‍යය වෙන්නේ. මෙතැන ආරම්මණාධිපති කියලා කියන්නේ නෑ. මෙතන කුසල ධර්මය එක්ක පහළ වෙන්නාවූ සම්ප්‍රයුක්ත ධර්ම ටිකටයි හිතින් හටගන්නාවූ රූපයන්ටයි දෙකටම තමයි අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙන්නේ. මේක අපි මේ විදියට තේරුම් ගනිමු. ඒ තමයි අපේ පින්වතුන් දැන් බණ අහනවා මේ වෙලාවේ. මේ දහම් කථාව අහගෙන ඉන්නවා. මේ දහම් කථාව අහගෙන ඉන්නකොට සතුටක් ඇතිවෙනවා. අපි උපකල්පනය කරමු මේ ධර්ම කරුණු හොඳට තේරෙනකොට සතුටක් ඇතිවෙනවා කියලා. එතකොට ඒවා කුසල ධර්ම. ඒ කුසල සිත් ඇතිවෙන කොට ඒ හිතේ තිබෙන 'ඡන්දයයි' 'හිතයි' 'වීරිය ස්වභාවයයි' 'ප්‍රඥා ස්වභාවයයි' තිබෙනවානේ, ඔය හතරෙන් එක වෙලාවකට එක බැගින් එක්කෝ වීරිය එක්කෝ හිත, අධිෂ්ඨානය, එහෙම නැත්නම් ඡන්දය, අනිත්

චෛතසිකත් අප්‍රධාන වෙලා එතනට එනවා. දැන් තමන් මේ ටික අහගෙන ඉන්නකොට ඇතිවෙනවා හරි බලවත් කුසල් සිතක්. ඒකෙ තිබෙනවා අර ඡන්ද චිත්ත වීරිය විමංසා කියන ඒ ධර්මතා ටික (කුසල ධර්ම) **'කුසලස්ස ච අබ්‍යාකතස්ස ච'** කියලා කියන කොට ඒ හිතේ පහළ වෙන අනිත් නාම ධර්ම ටිකටයි ඒ එක්කම පහළ වෙන්නා වූ රූප ධර්ම වලටයි එකම වෙලාවේ, එනම් කුසලයටයි ඒවාගේම රූපයටයි දෙකටම ප්‍රත්‍යය වෙනවා, උදව් වෙනවා, උපකාර වෙනවා. ඒක නිසා කියනවා කුසල ධර්මය කුසලයටයි අව්‍යාකෘතයටයි දෙකටම අධිපති වෙනවා කියලා. හිතක් පහළ වෙනකොට තනියෙන් නොවෙයි එන්නේ, රංචුවක් එන්නේ. ඒ රංචුව එනකොට යම් කිසි දෙයක් එතැනදී ප්‍රධාන වෙනවා අනිත් ඒවාට බලපාන්න. ඒ කථාව තමයි මෙතැනදී මේ කියන්නේ. **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන කථාව.

තවත් එකක් තිබෙනවා. ඕක විස්තර කරනවා මෙහෙම. **කුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො =** කුසල අධිපති කියන්නේ අපි ඉස්සෙල්ලා කථා කළා කුසල ධර්ම 21 ක් කියලා. ඒ 21 = කාමාවචර සිත් 8 + මහග්ගත සිත් 9 + ලෝකෝත්තර 4 මේ කුසල් ටික ඔක්කොම 'කුසලාධිපති'. ඒ සිත් පහළ වෙන කොට එවගේ තිබෙන නාම ධර්ම එනම් 'වේදනාව' 'සංඥාව' 'සංස්කාර' 'විඤ්ඤාණ ධර්ම' වලට සහ ඒ හිතත් සමග පහළ වෙන සමුට්ඨානික රූප වලට අධිපති භාවයෙන් ඉදිරිපත්වෙලා ක්‍රියාත්මක වෙනවා 'සහජාත අධිපති' වශයෙන්. එතකොට 'සහජාත' කථාව ආපු ගමන් අපි තේරුම් ගන්න ඕන හිතට හොඳට පිංතූර වෙන්න ඕන හිතට හොඳට දැනී යන්න ඕන මේ කියන්නේ ඡන්දයයි චිත්තයි වීරියයි විමංසාවයි කියන හතර දෙනා බව. ඒ හතර දෙනා සහජාත වෙලා ළඟ ඉන්නාවූ අනිත් නාම ධර්මවලට බලපානවා වගේම ඒ හිතත් එකක් පහළ වෙන රූප ධර්ම වලට බලපානවා. ඒක නිසා ඒ කථාව තමයි මේ කියන්නේ.

එතකොට අපි දැන් කුසල සිත්වාර, ඒ කියන්නේ වීථි වාර හතරක් ඉස්සරහට ගියා. දැන් මම මේ වෙලාවේ මේ පින්වතුන්ට කියලා දුන්නේ මේ හතරයි. අධිපති ප්‍රත්‍යය පිළිබඳව විසර්ජනා වාර 10 ක් තිබෙනවා. ඒකෙ හතරක් කිව්වා දැන්.

1. කුසල ධර්මයක් කුසල ධර්මයන්ට අධිපති වෙන ආකාරය, ආකාර දෙහෙකින්.

2. කුසල ධර්මයක් අකුසල ධර්මයට අධිපති වෙන ආකාරය එක විදියකින්
3. කුසල ධර්මයක් අව්‍යාකෘතයන්ට අධිපති වෙන ආකාරය, ආකාර දෙහෙකින්
4. කුසල ධර්මයක් කුසල ධර්මයකට සහ අව්‍යාකෘතයකට අධිපති වෙන ආකාරය එක ආකාරයකින්.

ඔය හතර තමයි මේ පින්වතුන්ට මේ වෙලාවේදී මතක් කළේ. මේ අභිධර්ම කථාවට එන්නේ ඒකට ගැලපෙන හිත් තිබෙන අය පමණයි. එහෙම එකක් තිබෙනවා. එහෙම නැති අය ආවත් ඇත්ත වශයෙන්ම වැඩකුත් නෑ. හේතුව මේක හසු කරගන්න බෑ. නිකං කාලය මැරීමක් පමණයි. හොඳට හිතන්න පුළුවන් හොඳට මෙනෙහි කරන්න පුළුවන් හිතක් තිබෙන ශක්තියක් තිබෙන අය මේකට ඒම හරි වටිනවා. මේ පින්වතුන් බොහොම ඕනෑ කමින් මෙච්චර කාලයක් මේක අහගෙන කථා කරගෙන තවත් ඔය ලෝකයේ ඉන්න අයට මේවා කියලා දීලා බෙදාගෙන මේ යන්නේ. අතිශය සූක්ෂම වූ ගාම්භීර වූ ඥානයකින් දැක වදාළ විස්තරකොට වදාළ ඒ වාගේම බුදුරජාණන්වහන්සේගේ කාරුණික අනුමැතිය ලැබිච්ච, සාරිපුත්‍ර මහා රහතන්වහන්සේ නොයෙක් ක්‍රම ගලපා අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨාන විෂයාන්තරගත වූ ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ඥානයට අනුයාත විග්‍රයක් උන්වහන්සේගේ ධර්ම නියායේ පිහිටා සිද්ධ කරන්නේ සැරියුත් මහා රහතන්වහන්සේ. උන්වහන්සේට වැඳ වැඳ උන්වහන්සේ ගැන හිත හිතා උන්වහන්සේගේ ඥානයේ තිබෙන ප්‍රභාෂ්වරය, ආලෝකය උන්වහන්සේගේ ඥානයේ තිබෙන විසිතුරු කම හිතහිතා ඒ ඥානයෙන් දැකපු විස්තර කරපු ටික තමයි මේ පුළු පුළුවන් හැටියට කථා කරන්නේ. මෙහෙම කියන කොට සමහර තැන්වලදී කෙනෙකුට ඇතිවෙන්න පුළුවන් පැහැදිලි අවබෝධයක්, තරමක අවබෝධයක්, බාගයක අවබෝධයක් සමහර විට හොඳම අවබෝධයක් ඇතිවෙන්න පුළුවන්. මේ හැම කෙනාටම ඉතාමත්ම හොඳින් අවබෝධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා. ඉදිරි සතියක අපි හමු උනහම නැවත අපි මේ ගැන හොඳට හිතල බලලා සාකච්ඡා කරලා අපි ඉතිරි කොටසත් ඉගෙන ගනිමු. අධිපති ප්‍රත්‍යය යටතේ පේළි දහයක් තිබෙනවා කථා කරන්න. අපි මේ කථා කළේ පේළි 5 ක් පමණ. නමුත් ඉදිරියේදී අකුසල පැත්තට යමු. සැම දෙනාටම නිවැරදි ධර්ම අවබෝධය සිද්ධ වේවා! නිවැරදි ධර්මය කියලා දෙන උතුම් සත්පුරුෂ කල්‍යාණමිත්‍ර ගුණ ඇති බ්‍රහ්ම ලෝකයෙන් දිව්‍යලෝකයෙන් කල්‍යාණගුණ පුරලා මනුෂ්‍ය ලෝකයෙන් චුත වෙලා අපවත්වෙලා නැවත මනුස්සලෝකකයේම ඉපදිච්ච ඉතාමත්ම සාසනයට කැප වෙච්ච උතුම් ගුණ

තිබෙන කල්‍යාණමිත්‍රයෝ මේ පින්වතුන්ට හමුවේවා! මුණ ගැසේවා! දකින්ට ඇසුරු කරන්න ලැබේවා! සත් පුරුෂ ස්වරූපය අරගෙන සත් පුරුෂයෝ හැටියට පෙනී ඉඳිමින් අසත් පුරුෂ වූ වැඩ කරන්නාවූ අසත්පුරුෂයෝ හමු නොවේවා! දකින්ට අහන්න නොවේවා! නියම උතුම් සත්පුරුෂ කල්‍යාණගුණ ඇති උත්තමයන් දිව්‍යලෝකෙත් බ්‍රහ්මලෝකෙත් මනුස්සලෝකෙත් ඒ කල්‍යාණ ගුණ ඇති උත්තමයන්ගේ ධර්මයම නිවැරදිව පැහැදිලිව කලට වෙලාවට මේ පින්වතුන්ට අහන්න ලැබේවා! නියම ධර්මය හිතට කාවැදිලා අධර්මය අධර්මය හැටියට තේරුම් අරගෙන ඒක සම්පූර්ණයෙන්ම හිතින් ප්‍රතික්ෂේප කිරීමේ ඍජු කුසල ශක්තිය ඒ සත්පුරුෂ ශක්තිය සැමදෙනාටම පහළ වේවා! යෝනිසෝ මනසිකාරය ගුණය වැඩේවා! යෝනිසෝ මනසිකාරය තිබෙන කොට නුවණින් හිතන්න පෙළඹෙනකොට මෙනෙහි කරන කොට කළු සුදු හඳුනා ගන්න හොඳට පුළුවන්. කුසලය අකුසලය දැන ගන්න පුළුවන්. සත්පුරුෂයා අසත්පුරුෂයා හොඳට තේරුම් ගන්න පුළුවන්. ඒවාගේම හොඳට නුවණින් තේරුම් අරගෙන ධර්මය අධර්මය තේරුම් අරගෙන ඒ අනුව ධර්ම අනු ධර්ම ප්‍රතිපදාවේ යෙදෙන්න. සත් තිස් බෝධිපාක්ෂික ධර්ම කියන්නේ මොනවාද, අධර්මයක් හරහා ධර්ම නමින් බෝධිපාක්ෂික වඩන්න යන්නේ නැතුව ධර්මයක් හැටියටම ධර්මය තේරුම් අරගෙන නියම බෝධිපාක්ෂික ධර්මයන් වඩාගෙන මේ පින්වත් සැම දෙනාටම සංසාර දුකෙන් මිදිලා ඒ ආර්ය උත්තමයන් වහන්සේලා අනන්ත අපරිමාණ ලොව්තුරා බුදුරජාණන්වහන්සේලා අනන්ත අපරිමාණ පසේ බුදුරජාණන්වහන්සේලා රහතන් වහන්සේලා නිවී සැනසී අවබෝධකොට ගත්තාවූ නිවී සැනසී ගියාවූ නිවී සැනසෙමින් මිත්‍යා දෘෂ්ඨියෙන් මිදෙමින් ඒවාගේම ආත්ම සංඥාවෙන් මිදෙමින් දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය කියන ධර්මය ඉතාමත්ම හොඳින් නිවැරදිව අවබෝධ කර ගනිමින් අනිත්‍යය ලක්ෂණය දුක්ඛ ලක්ෂණය අනාත්ම ලක්ෂණය නිවැරදිව අවබෝධ කරගනිමින් ඒ නිර්වාණ ධාතුව මේ පින්වතුන් සැම දෙනාටමත් මේ කුසල් බලයෙන් හමුවේවා! හිතට මුණ ගැහේවා! නුවණට සපර්ෂ වේවා! ඒ නිර්වාණ ධාතුව ස්පර්ශ වීමෙන් සියලු දෙනාගේම දැවෙන්නාවූ හිත් සියල්ල නිවී තුනී වී සැනසීමටම පත් වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු සාධු සාධු ස්වාමීන්වහන්ස. අනන්ත අප්‍රමාණ පින්. මේ ධර්ම දානමය පින ඔබ වහන්සේටම අනුමෝදන් කර සිටිනවා, ඔබ වහන්සේ

බලාපොරොත්තුවෙන ආකාරයෙන්ම සියලු කෙලෙස් නසා ගැනීම සඳහා. නැවත වරක් ඔබ වහන්සේගේ පාද නමස්කාර කරමින් පුණ්‍යානුමෝදනා කරනවා. ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ ධර්ම දේශනාව නිමාවට පත් කරනා ලෙස ස්වාමීන්වහන්ස, තෙරුවන් සරණයි!

හොඳයි, පින්වත්නි අපේ ලලිත් දළුවත්ත මහත්මයා කල්‍යාණමිත්‍ර හිතෙන් යුක්තව මේ වැඩ පිළිවෙලක් හදාගෙන අවුරුදු ගානක් මේ වැඩ පිළිවෙල ගෙනැල්ල තිබෙනවා. ඒකෙ අපිටත් පුළුවන් හැටියට කොටස් කාරයෝ වෙලා ධර්ම දානයක් සිද්ධ කරන්න අවස්ථාව සලසා තිබෙනවා. මේ පින්වතුන්ට අහන්න සැලසිලා තිබෙනවා. ඒක නිසා අහන්නයි දෙසන්නයි දෙකටම අපිට අවස්ථාව සැලසුනේ උතුම් කල්‍යාණ මිත්‍ර අදහස නිසා. ඒ පින්වත් මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් ඒ වාගේම මේ දහම් වැඩ සටහනට අනිත් අය එක්කාසු කරගෙන පෙළ ගැස්සීමේ වැඩ කරන්නාවූ පින්වත් ජයන්ත මහත්මයාටත් අනිත් ඉදිරිපත් වෙන්නාවු කල්‍යාණ මිත්‍ර ගුණ ඇති ධර්මයම අවංකව හොයාගෙන යන්නා වූ මේ පින්වතුන්ටත් ලෝකයේම අසාගෙන ඉන්නාවූ සත්පුරුෂ සැමදෙනාටමත් මේ උතුම් ධර්මයේ බලයෙන් ඒකාන්තයෙන්ම සැනසිල්ලක් වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම අපේ ලලිත් මහත්මයාට නිදුක් නිරෝගී දීර්සායුෂ වේවා! මේ හැම දෙනාටම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගෙන නිවනින්ම සැනසෙන්ට ලැබේවා! කියලා මම නැවත වතාවක් ප්‍රාර්ථනා කරමින් වැඩ සටහන අවසන් කරනවා. සැම දෙනාටම රත්නත්‍රයේ පිහිටයි.

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි